[සියලු ම හිමිකම් ඇවිරිණි /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට / විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන
විවෘත තරග විභාගය - 2010 (2011)

## (01) අවබෝධය

පැය එකයි මිනිත්තු තිහයි

● ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන පාඨ කියවා, එක් එක් පාඨයෙහි ප්‍රධාන අදහස නැවතත් කෙටියෙන් එක් වාක්‍යයකින් ලියා දක්වන්න. **පද තර අකුරින්** දැක්වෙන යෙදුම්වලට විවරණ සපයන්න.

(i) ප්‍රධාන මුහුදු මාර්ගවලට ඇති ආසන්නතාව, **ඉහළ සාක්ෂරතාව**, දුප්පත් ලෙස පැවතීම සහ ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති යන උපාය මාර්ගික වශයෙන් හිතකර තත්ත්වයන් පැවතිය ද, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර තරඟකාරීත්වය පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා වැනි අංශවලට සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය උපයන මාර්ග ලෙස රට තුළ ම දියුණු කළ හැකි වුව ද බොහෝ ශ්‍රී ලාංකිකයෝ එම සේවාවන් විශාල වශයෙන් විදේශ රටවලින් මිලට ගනිමින් සිටිති.

(ii) විසිතුරු පැළ සහ මල් වගා අංශය පසුගිය වසර කීපය තුළ දී පැහැදිලි වර්ධනයක් පෙන්විය. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගය මෙන් ම පුද්ගලික ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරී දායකත්වය ද ඉවහල් විය. විසිතුරු පැළ සහ මල් වගා අංශය සඳහා **ආකර්ෂණීය දේශීය සහ විදේශීය වෙළඳපොළක්** පවතී. සමාජය තුළ පවත්නා ඉහළ ඉල්ලුම, පැරසිලි සහ ප්‍රදර්ශන සඳහා යොදාගැනීම තුළින් පෙනෙන්නේ මේ අංශය දේශීය වෙළඳපොළ තුළ පුළුල් වන බවයි.

(iii) 2002 දී සම්මත කරන ලද සුභසාධන පනත සුභසාධන වැඩසටහන් **පාරදෘශ්‍යතාවකින්** යුතුව ඉලක්ක කරා යාම සඳහා නෛතික රාමුවක් සපයයි. මෙම පනත ක්‍රියාත්මක කිරීම මගින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහතික කෙරෙන අතර ප්‍රතිලාභ ලබාදීම සඳහා සුදුසු පවුල් තෝරා ගැනීමත් අනිකුත් සුභසාධන වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලබන පවුල් ඉවත් කිරීම සහ අවසන් වශයෙන් දුප්පත් පවුල් සඳහා ප්‍රතිලාභ වැඩිකිරීමත් සහතික කෙරේ.

2. පහත දැක්වෙන ඡේදය වචන **85ක් පමණ** වන සේ සාරාංශ කොට ලියා එට **සුදුසු මාතෘකාවක්** ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන සංඛ්‍යාව ලියා දක්වන්න.

තිරසාර පදනමක් යටතේ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා උසස් ගුණාත්මක වර්ධනයක් අවශ්‍ය බව පිළිගෙන ඇත. ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගැනීමට වඩාත් සුදුසුතම සාර්ව ආර්ථික රාමුව වෙළඳපොළ හිතකාමී ආර්ථික ප්‍රතිපත්ති ක්‍රමෝපාය බව රටේ පවත්නා සියලුම දේශපාලන පක්ෂ පාසේ පිළිගෙන ඇත. තවද ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගැනීම සහතික කිරීම පිණිස ආර්ථික ප්‍රතිසංස්කරණ සහ දැඩි ප්‍රතිපත්ති ගැලපුම්වල අවශ්‍යතාව සියලුම ප්‍රධාන දේශපාලන පක්ෂ ද පෞද්ගලික අංශය සහ ශ්‍රී ලංකාවට ආධාර කරන ජාත්‍යන්තර ප්‍රජාව ද නැවත නැවතත් අවධාරණය කර ඇත. කෙසේ වෙතත් මේ ප්‍රතිපත්ති වෙනස් කිරීම, ප්‍රතිසංස්කරණ කිරීමේ වේගය සහ ප්‍රමාණය පිළිබඳව මෙන්ම ඒවායේ අනුපිළිවෙළ සහ ක්‍රියාත්මක කරනු ලබන වකවානු පිළිබඳව ද ඔවුනොවුන් අතර යම් යම් වෙනස්කම් පවතී. එහෙත් මෙම ගැටලු පිළිබඳව පුළුල් සහභාගිත්වයෙන් යුතුව කරනු ලබන විවෘත සාකච්ඡා මගින් ඒකමතිකතාව ගොඩනැගිය හැකි ය. තව ද බලපෑමට ලක් වන සියලු දෙනාගේ ප්‍රමාණවත් සහයෝගිතාවකින් තොරව ප්‍රතිපත්ති ගැලපුම් සහ ප්‍රතිසංස්කරණවල උපරිම ප්‍රතිඵල ලබාගැනීම ප්‍රායෝගිකව අපහසු වේ. එම නිසා මෙවැනි බරපතළ තීරණ ගැනීමේ දී අවශ්‍ය කෙරෙන ජාතික ඒකමතිකභාවයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රතිපත්ති සැලසුම් සහ ප්‍රතිසංස්කරණ සමග ඒවායේ

[ 2 වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK